# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2013 අංක 4 දරන ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2013 පෙබරවාරි මස 21 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2013 පෙබරවාරි මස 22 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 4.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2013 අංක 4 දරන ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2013 පෙබරවාරි මස 21 වැනි දින]

එල්. ඩී.— ඕ. (අයි.එන්.සී.) 1/2012.

**(301 වන අධිකාරය වූ) ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය 1942 අංක 59 දරන ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය ආඥා පනත මගින් සංස්ථාගත කරනු ලැබූ හෙයින් ද : පූර්විකාව.

ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය, එහි නාමය "ශ්‍රී ලංකාවේ දයාවේ සොහොයුරන්ගේ සංගමය" යනුවෙන් වෙනස් කිරීමට දැන් අදහස් කරන හෙයින් ද :

එකී නාමය වෙනස් කිරීම බලාත්මක කිරීම සඳහා එම ආඥාපනත සංශෝධනය කිරීමට ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය දැන් ඉල්ලුම්කර ඇති හෙයින් සහ එම ඉල්ලීම ප්‍රදානය කිරීම යෝග්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2013 අංක 4 දරන ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (301 වන අධිකාරය වූ) ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය ආඥාපනතේ දීර්ඝ නාමයේ හැර හෝ එකී ආඥාපනත යටතේ සාදන ලද හෝ නිකුත් කරන ලද යම් රීතියක, දැන්වීමක හෝ වෙනත් ලේඛනයක (එම නාමයෙන් හෝ "ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්" යන කෙටි යෙදුමෙන්) ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය සඳහන් කරනු ලැබ ඇති සෑම අවස්ථාවක, පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, "ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය" යන යෙදුම සහ "ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්" යන යෙදුම වෙනුවට "ශ්‍රී ලංකා දයාවේ සොහොයුරන්ගේ සංගමය" සහ "ශ්‍රී ලංකා දයාවේ සොහොයුරන්" යන යෙදුම් ආදේශ කරනු ලැබිය යුතු ය. "ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය" සහ "ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්" යන්න පිළිවෙලින් "ශ්‍රී ලංකා දයාවේ සොහොයුරන්ගේ සංගමය" සහ "ශ්‍රී ලංකා දයාවේ සොහොයුරන්" යනුවෙන් හැඳින්විය යුතු බව.

2-PL 006394—2,590 (2011/11)

කොන්ත්‍රාත් ගිවිසුම්, නඩුකර, අභියාචන, අයිතිවාසිකම් සහ බැඳීම් ආදිය දිගටම පවත්වාගෙන යාම.

**3.** (1) "ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය" විසින් හෝ එහි වාසියට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දිනයට පෙරාතුවම සාදන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද කවර හෝ සියලුම කොන්ත්‍රාත්, ගිවිසුම්, සහතික හෝ වෙනත් සාධන පත්‍ර හෝ ලේඛන, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී හෝ එදිනට පසුව, "ශ්‍රී ලංකා දයාවේ සොහොයුරන්ගේ සංගමය" විසින් හෝ එහි වාසියට සාදන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද ලෙසට සලකනු ලැබිය යුතු ය.

(2) "ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමය" විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබ, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී විභාග වෙමින් පවතින සියලුම සිවිල් නඩු, නඩුකර, අභියාචන සහ වෙනත් නඩු කටයුතු නතරවීම හෝ පවත්වාගෙන යාම නතර කිරීම නොවිය යුතු අතර, ඒවා "ශ්‍රී ලංකා දයාවේ සොහොයුරන්ගේ සංගමය" විසින් හෝ එයට එරෙහිව දිගටම පවත්වාගෙන යාම හෝ බලාත්මක කිරීම කරනු ලැබිය හැකිය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී (1) වන උපවගන්තියේ සඳහන් අයිතිවාසිකම්, බැරකම් සහ බැඳීම් හැර "ශ්‍රී ලංකා ශාන්ත ජෝසප් සොහොයුරන්ගේ සංගමයේ" සියලුම අයිතිවාසිකම්, බැඳීම් සහ වගකීම්, "ශ්‍රී ලංකා දයාවේ සොහොයුරන්ගේ සංගමයේ" අයිතිවාසිකම්, බැඳීම් සහ වගකීම් ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.